හෙලිටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් **- 2016/2017**

**-----------------------------------------------**

හෙලිටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකාරීත්වයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

**---------------**

## 2.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

මෙම වාර්තාවේ **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, හෙලිටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

අ) 2017 මාර්තු 31 දිනට ලැබිය යුතු රු. 5,280,539 ක් වූ ගුවන් ටිකට්පත් විකිණීමෙන් ලද ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

ආ) හෙලිටුවර්ස් අභ්‍යාස විද්‍යාලයේ මෙහෙයුම්වලින් සිදු වූ අලාභය වූ රු. 2,956,396 ක් වෙනම සඳහන් කිරීම වෙනුවට සමාගමේ ආදායමින් හිලව් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් බදු වියදම රු. 827,791 ක් අඩුවෙන් දක්වා තිබුණි.

ඇ) සමාලෝචිත වර්ෂය සඳහා වූ පොළිය මත බද්ද ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් රු.371,474 ක් අඩුවෙන් දක්වා තිබුණි. තවද, සමාගම ලාභාංශ බෙදා හැර නොතිබූ බැවින්, සමාගම විසින් පෙර වර්ෂයේ උපයාගත් ලාභය මත පදනම්ව ලාභාංශ නිර්දේශ ගණනය කර නොතිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් ලැබිය යුතු, වසරකට වැඩි කාලයක් හිඟව පැවති, වෙළෙඳ ණය ගැති ශේෂ එකතුව වූ රු. 5,280,539 ක් අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති, රීති සහ රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පුහුණු පාසලේ මෙහෙයුම් පිරිවැටුම මත ජාතිය ගොඩනැගීමේ බද්ද. 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 04 වැනි වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවට අනුකූලව ගෙවිය යුතු දේශීය නියෝජිතයාගේ කොමිස් මුදල් ගෙවා නොතිබුණි.

# 3. මූල්‍ය සමාලෝචන

## 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ඉකුත් වර්ෂයේ අනුරූප අතිරික්තය වූ රු. 3,688,303 ට සාපේක්ෂව, සමාලෝචිත වර්ෂයේ සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු. 7,978,040 ක අතිරික්තයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව, සමාලෝචිත වර්ෂයේ රු. 4,289,737 ක වැඩිවීමක් පැවතුණි. වෙනත් මෙහෙයුම් වියදම් රු.12,116,725 කින් අඩු වීම මෙම වැඩිවීමට ප්‍රධාන හේතුව විය.